ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංකඃ 2477424, 2477423, 2477311
ෆැක්ස්ඃ 2346257, 2477739
ඊ-මේල්ඃ dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවියඃ www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2017 මැයි 15 |

## ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශක සමීක්ෂණය - 2017 අප්‍රේල්

- **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 අප්‍රේල් මාසයේ දී 41.8 ක දර්ශක අගයක් වාර්තා කරමින්, 2017 මාර්තු මාසයට සාපේක්ෂව දර්ශක අගයයන් 24.7 කින්, සෘතුමය සාධක හේතුවෙන් පහළ යන ලදී. ඒ අනුව, අප්‍රේල් මාසයේ දී නිෂ්පාදන ක්‍රියාකාරකම්වල යම් පහත වැටීමක් පෙන්නුම් කරයි. නිෂ්පාදන සහ නව ඇණවුම් උප දර්ශක, මාර්තු මාසයේ දී වාර්තා කළ සැලකිය යුතු වර්ධනයට සාපේක්ෂව මෙම මාසය තුළදී පහත වැටීම මේ සඳහා විශාල වශයෙන් දායක විය. එසේම, අලුත් අවුරුදු උත්සව සමය හේතුවෙන් සාමාන්‍යයෙන් අප්‍රේල් මාසයේ දී වැඩි නිවාඩු දින ගණනක් පැවැතීම ද නිෂ්පාදන කටයුතු පහත වැටීම කෙරෙහි හේතු වූ බව සමීක්ෂණයට තොරතුරු සපයන්නන් විසින් සඳහන් කරන ලදී. තවද, සියලුම උප දර්ශක පසුගිය මාසයට සාපේක්ෂව පහත වැටුණු අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය යන උප දර්ශකය හැර අනෙකුත් සියලුම උප දර්ශක කඩඉම් මට්ටම ලෙස ගැනෙන දර්ශක අගය වන 50.0 ට වඩා අඩු අගයක් වාර්තා කරන ලදී. කෙසේ වුවද, ඉදිරි මාස තුන සඳහා ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ අපේක්ෂාවන් යහපත් වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

- **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය,** 2017 මාර්තු මාසයේදී වාර්තා වූ 60.8 ක දර්ශක අගයට සාපේක්ෂව අප්‍රේල් මාසයේදී 54.2 ක දර්ශක අගයක් වාර්තා කරන ලදී. ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකයෙහි සිදු වූ මෙම පහල යාමෙන් පෙන්නුම් කෙරෙන්නේ අප්‍රේල් මාසයේදී සේවා අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් මාර්තු මාසයට සාපේක්ෂව සැළකිය යුතු අඩු වේගයකින් වර්ධනය වූ බවයි. සේවා අංශයෙහි අඩු වේගයකින් සිදු වූ වර්ධනයට නව ව්‍යාපාර, ව්‍යාපාර ක්‍රියාකාරකම් හා අපේක්ෂිත ඉදිරි ව්‍යාපාර ක්‍රියාකාරකම් හේතු විය. නිම කිරීමට ඇති කාර්යයන් සහ සේවා නියුක්තිය මාර්තු මාසයට සාපේක්ෂව අප්‍රේල් මාසයේදී පහත වැටුණි. සමීක්ෂණය ආරම්භ කළ 2015 මැයි මස සිට සේවා නියුක්ති උපදර්ශකය 50 සීමාවෙන් පහළ අගයක් ගත් ප්‍රථම අවස්ථාව මෙය වූ අතර නව බඳවාගැනීම් ප්‍රමාද වීම ඊට ප්‍රධාන වශයෙන් හේතු විය. සේවා අංශයේ ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශකය ගණනය කිරීමේදී සළකා නොලබන අය කරන මිල ගණන් උපදර්ශකය 2017 අප්‍රේල් මාසයේදී පසුගිය මාසයට සාපේක්ෂව ඉහළ යන ලදී. තවද, ශ්‍රම පිරිවැය පිළිබඳ අපේක්ෂා මඟින් මනිනු ලබන ඉදිරි ශ්‍රම පිරිවැය, 2017 අප්‍රේල් මාසයේදී තවදුරටත් ඉහළ ගියේය.

| | ව\මා | ජන. | පෙබ. | මාර්. | අප්‍රේ. | මැයි | ජූනි | ජූලි | අගෝ. | සැප්. | ඔක්. | නොවැ. | දෙසැ. |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 67.3 | 57.5 | 55.5 | 56.5 | 53.2 | 57.8 | 54.8 | 57.9 |
| | **2016** | 51.9 | 55.3 | 60.7 | 41.6 | 47.9 | 55.1 | 50.6 | 53.5 | 57.7 | 56.5 | 58.4 | 58.3 |
| | **2017** | 56.2 | 57.1 | 66.5 | 41.8 | - | - | - | - | - | - | - | - |
| **සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** | **2015** | n.a. | n.a. | n.a. | n.a. | 66.8 | 65.0 | 60.6 | 59.8 | 61.7 | 59.5 | 59.3 | 60.2 |
| | **2016** | 58.0 | 59.3 | 61.6 | 54.7 | 58.1 | 56.3 | 57.8 | 61.2 | 57.7 | 59.3 | 59.7 | 59.8 |
| | **2017** | 57.5 | 57.3 | 60.8 | 54.2 | - | - | - | - | - | - | - | - |

## නිෂ්පාදන අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය




## සේවා අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය



තාක්ෂණික සටහන:

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මෙම සමීක්ෂණයෙහි නියැදි රාමුව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද බස්නාහිර පළාතෙහි ස්ථානගත වී ඇති විශාල සමාගම් මත පදනම් වී ඇත. දළ දේශීය නිෂ්පාදිතයට දක්වන ආංශික දායකත්වය පදනම් කර ගනිමින් නිෂ්පාදන සහ සේවා කටයුතු සඳහා මාසිකව අවම වශයෙන් ප්‍රතිචාර 100 බැගින් වූ ඉලක්කයක් පවත්වාගෙන යනු ඇත.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| ගැනුම් තොගය | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමු ද්‍රව්‍යය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |
| නිමකිරීමට නියමිත කාර්යයන් | : ව්‍යාපාරික ක්‍රියාකාරකම් ඉහළයාම හේතුවෙන් නිම කිරීමට නොහැකි වූ ඇණවුම් |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.